**දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයිමාර්ග-II) - 2023**
**------------------------------------------------------------------------------**

දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයිමාර්ග-II) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළැඹි අංක 3579 එස්ආර්අයි සහ අංක 3580 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම්, 2019 නොවැම්බර් 13 දින එළැඹි අංක 3851 එස්ආර්අයි ණය ගිවිසුම, 2021 මැයි 28 දින එළැඹි අංක 4067 එස්ආර්අයි යන ණය ගිවිසුම සහ 2023 නොවැම්බර් 28 එළැඹි 4384 එස්ආර්අයි ණය ගිවිස්මවල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 165,185 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,084.60 ක් වන අතර ඉන් රු.මිලියන 137,070 කට සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 28,115 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2027 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටස් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහනෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස, මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- වැඩසටහනෙහි අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 8 ට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළ අවලංගු කරන ලද කොන්ත්‍රාත් 07 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මත අවිනිශ්චිත අයවීම් සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | 1,453.96 | කොන්ත්‍රාත් අවලංගු කිරීමෙන් පසු, කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව අත්තිකාරම් අය කර ගැනීමට සේවායෝජක විසින් ක්‍රියමාර්ග ගෙන තිබුණි. කොන්ත්‍රාත්කරුවන් හය දෙනෙකුගේ අත්තිකාරම් ගෙවීම් | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැඳුම්කර මුදල් කර ගැනීමට නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර ලැබියයුතු ලෙස වාර්තා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සහතිකවල වලංගුතාවය දීර්ඝ කර තිබුණි. එමනිසා සේවායෝජකගේ දෘෂ්ඨිකෝණය අනුව කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව අයවීම් අවිනිශ්චිත නොවනු ඇත. | |
| (ආ) | ආරවුල් බේරුම්කරණ මණ්ඩලයේ හිමිකම් පෑම් සඳහා වූ රු.මිලියන 907 ක ප්‍රතිපාදනය, රසායානාගාර, ගෘහ භාණ්ඩ හා මිනින්දෝරු උපකරණ සඳහා ගෙවීම් සහ අවලංගු කරන ලද කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට සත්‍යාපනය කිරීමට නොහැකි විය. | 907 | පවතින සීමිත කාර්යය මණ්ඩලයත් සමඟ තොරතුරු එකතු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඉල්ලන ලද තොරතුරු නියමිත දිනට විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | එක් එක් බේරුම්කරණ කටයුත්ත සඳහා වෙන වෙනම ලිපිගොනු හා ලේඛණ පවත්වා ගත යුතු අතර සියළුම කොන්ත්‍රාත් පරිපාලන ලේඛණ බේරුම්කරණ කටයුතු විසඳන තෙක් තබා ගත යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත්කරුවන් විසින් ඔවුන්ගේ වියදමින් කාර්යසාධන සුරක්ෂණ සැපයිය යුතු වුවත්, කොන්ත්‍රාත්කරුට හිමිකම් පෑමට හැකි වන පරිදි ප්‍රමාණපත්‍රවල මූලික හා පොදු අයිතම යටතේ වෙනම ගෙවීම් අයිතමයක් යොදා තිබුණි. ඒ අනුව, කාර්යසාධන සුරක්ෂණවල පිරිවැය ප්‍රතිපූරණය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 85.64 ක මුදලක් ගෙවා තිබුණි. | ප්‍රමාණපත්‍ර අයිතමයක් ලෙස සහ කොන්ත්‍රාත් කොන්දේසි අනුව මෙම අයිතමය සඳහා ගෙවා ඇත. කෙසේ වුවද, ඉදිරි පැකේජවලින් මෙම අයිතමයන් ඉවත් කර ඇත. | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල විය යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 හා 2.6 උප වගන්ති | ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛණ හා ප්‍රමාණ පත්‍ර නිවැරදිව විශ්ලේෂණය කළ යුතු වුවද, බීඒ 4 සහ බීඒ 5 කොන්ත්‍රාත් පැකේජවලට අදාලව ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛණ හා ප්‍රමාණ පත්‍ර අයිතමවල අනුපාත විෂමතා හා වැරදි අර්ථකථන හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහනට රු.මිලියන 48.2 ක අලාභයක් සිදු වී තිබුණි. වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සාක්ෂි විගණනයට අනාවරණය නොවීය. | තරඟකාරී පදනම මත ප්‍රසම්පාදනය සිදු කරන ලදී. සමස්ත ලංසු මිල සාධාරණ වන විට ඉහළ අනුපාතික අයිතම සඳහා එකඟතාවයන්ට පැමිණීමට ආ.සං.බැ. මාර්ගෝපදේශවල ප්‍රතිපාදන නොමැත. | අලාභ අය කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි 108.4 හා 120.7 උප වගන්ති | වැඩසටහන අවසානයේ සියලුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දුන්නද, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ සඳහා පිළිවෙලින් රු.මිලියන 518.99 ක් හා රු.මිලියන 14.13 ක මුදලක් 2022 වන විට එකවර ගෙවා තිබුණු අතර සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද මුදල තහවුරු කර ගැනීමට නොහැකි විය. මේ අනුව, හිතකර කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ගෙන දිය හැකි බව මෙමඟින් පෙන්නුම් කෙරේ. | කොන්ත්‍රාත්කරු විසින් මෙම අනුපාත සඳහන් කර ඇත්තේ ඉදිකිරීම් කාලය තුළ පමණක් උපකරණ භාවිතා කිරීම සඳහාය. එම නිසා, මෙම කොන්දේසිය කොන්ත්‍රාත්කරුට කිසිදු අනවශ්‍ය ප්‍රතිලාභයක් ලබා නොදේ. තවද, මා.ස.අ. සතුව සමාන උපකරණවල ප්‍රමාණවත් තොග පවතින බැවින්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මෙම කොන්දේසි කෙටුම්පත් කර ඇත. | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි බලාත්මක කිරීමට පෙර ගැඹුරින් සමාලෝචනය කළ යුතුය. සේවායෝජකගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, මුදලට වටිනාකමක් ලබා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම වැළැක්වීම සඳහා ලංසු ලේඛණ සමාලෝචනය කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |
| (ඈ) | 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛය - 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | මෙම කාලය තුළ වැඩ කටයුතු අත්හිටුවා තිබුණු බැවින්, රැස්වීම් නිතිපතා නොකැඳවන ලදී. | චක්‍රලේඛ උපදෙස් වලට අනුගත විය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය**

නැගෙනහිර, උතුර, ඌව සහ බස්නාහිර පළාත්වල තෝරාගත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මාර්ග හා ජාතික මාර්ග වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණ විය. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ)

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී. | ළඟා කරගෙන ඇති කාර්යසාධනය කි.මී. | | |
| ජාතික හා ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීම | ග්‍රාමීය මාර්ග | 3,654.95 | 2,115 | 2023 නොවැම්බර් යාවත්කාලීන කරන ලද පහසුකම් පරිපාලන අත්පොතට අනුව පළාත් 04 ක් යටතේ ග්‍රාමීය මාර්ග කි.මී. 3,654.95 ක් වැඩිදියුණු කිරීමට පැකේජ 53 ක් නිර්මාණය කර | රජයේ ණය ගැනීම් සීමා කිරීම හා කොන්ත්‍රාත් අවසන් කිරීම ප්‍රමාදවීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට කි.මී. 2,115 ක් එනම් සියයට 57.87 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** කෙසේවුවද, රජයේ ණය ගැනීම් සීමා කිරීම හේතුවෙන් සම්පූර්ණ විෂය පථය සම්පූර්ණ කිරීමට හැකියාවක් නොමැත. ණය අදියර 4 ක්‍රියාත්මක වීමත් සමඟ අත්‍යාවශ්‍ය වැඩ සම්පූර්ණ කිරීම සඳහා පියවර ගෙන ඇත.

**විගණකගේ නිර්දේශය** කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය.

(ආ)

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2023 දෙසැම්බර් 31 දිනට** | | **විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේකෂිත භෞතික කාර්යසාධනය කි.මී.** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය කි.මී.** | | |
| ජාතික හා ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීම | ජාතික මාර්ග | දිග කි.මී. 54.45 කින් යුතු ජාතික මාර්ග 06 | මාර්ග 05 ක ප්‍රගතිය සියයට 01 කට අඩු වීම හා 01 මාර්ගයක් සියයට 38 ක ප්‍රගතියක් ලඟා කර ගැනීම. | බස්නාහිර පළාත යටතේ තත්‍ය දිග කි.මී. 54.45 කින් යුතු ජාතික මාර්ග 06 ක් පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කළද, අපේක්ෂිත ඉලක්කය වූ සියයට 01 ත් 80 ත් සමඟ සංසන්දනය කිරීමේදී මාර්ග 05 ක භෞතික ප්‍රගතිය සියයට 01 කට අඩු බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට සියයට 100 ක අපේක්ෂිත ප්‍රගතියෙන් 2023 දෙසැම්බර් 31 දිනට සියයට 38 ක භෞතික ප්‍රගතියක් ලඟා කර ගැනීමට එක් පැකේජයකට (එන්ආර්/7) පමණක් හැකි වී තිබුණි. | රජයේ ණය ගැනීම් සීමා කිරීම හා කොන්ත්‍රාත් අවසන් කිරීම ප්‍රමාදවීම. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** අරමුදල් ගැටළු හේතුවෙන් බස්නාහිර පළාතේ ජාතික මාර්ග කොන්ත්‍රාත් 05 ක් සේවායෝජකගේ පහසුව සඳහා අවසන් කර ඇත. කෙසේවුවද, එක් කොන්ත්‍රාත්තුවක් (එන්ආර්/7) ක්‍රියාත්මක වෙමින් පවතී.

**විගණකගේ නිර්දේශය** කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය.

(ඇ)

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඉඩම් කැබලි** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඉඩම් කැබලි** | | |
| ජාතික හා ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීම | පරිත්‍යාග කරන ලද ඉඩම් අත්පත් කර ගැනීම | 4,075 | 2,752 | මාර්ග පුනරුත්ථාපන කටයුතුවලදී අදාල ඉඩම් හිමියන් විසින් වැඩසටහන වෙත ඉඩම් කැබලි 4,075 ක් පරිත්‍යාග කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම් කැබලි 1,323 කට සම්බන්ධ එකඟතා ලිපි සහ අනෙකුත් ලේඛන අදාල පළාත් පාලන ආයතන වෙත භාර දී නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදාල මාර්ග පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** මාර්ග පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීමෙන් පසු ඉඩම් කැබලි 1,323 ක් අදාල අධිකාරීන් වෙත භාර දෙනු ලැබේ.

**විගණකගේ නිර්දේශය** අදාල අධිකාරීන් වෙත ලේඛන භාරදීම සඳහා නිර්ණායක හඳුන්වා දිය යුතුය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.7 උප වගන්තිය ප්‍රකාරව සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකවල සහතික කළ වටිනාකම දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 5,558.94 ක් නිරීක්ෂණය විය. එයින් රු.මිලියන 1,188.03 ක අතුරු ගෙවීම් සහතිකපත් අගය 2022 වර්ෂයේ සහතික කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවා නොතිබුණි. තවද, කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.8 උප වගන්තිය ප්‍රකාරව, 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,074.11 ක ප්‍රමාද පොලී සඳහා ප්‍රතිපාදන සිදු කර තිබුණි. එම නිසා, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම රජයට අමතර පිරිවැයක් සහ වැය බරක් වනු ඇත. | 2023 මුල් භාගයේදී වැඩ අත්හිටුවා ඇති අතර අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා අතුරු ගෙවීම් සහතික පත් කිහිපයක ගෙවීම් අත්හිටුවා ඇත. කෙසේවුවද, වැඩසටහනේ ණය අදියර 4 ලැබීමෙන් පසු සැළකියයුතු අතුරු ගෙවීම් සහතිකපත් වටිනාකමක් ගෙවා ඇත. නමුත්, කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව, ප්‍රමාද ගෙවීම් සඳහා පොලී ගෙවීම් රජයේ අරමුදල් මඟින් ගෙවිය යුතු වේ. | ප්‍රමාද පොලී අවම කිරීමට පියවර ගත යුතු අතර හිමිකම්වල නිරවද්‍යතාවය සහතික කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම හා ඉතිරි මාර්ග පුනරුත්ථාපන කටයුතුවල විෂය පථය සීමාවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 8,197.88 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත විය හැක. | අරමුදල් සීමා කිරීම හේතුවෙන් පවතින බොහෝ කොන්ත්‍රාත්වල විෂය පථය සීමා කර ඇත. එම නිසා, සැලසුම් කල පරිදි අත්තිකාරම් අය කර ගත නොහැක. කෙසේවුවද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වල ඉතිරි වටිනකම අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | ඉතිරි මාර්ග පුනරුත්ථාපන කටයුතුවල විෂය පථය සීමාකිරීමේදී අත්තිකාරම් අයකර ගැනීමේ ක්‍රමවේදය ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට සේවායෝජක හා කොන්ත්‍රාත්කරුවන් විසින් ඌව, උතුර හා බස්නාහිර පළාත්වල කොන්ත්‍රාත් පැකේජ 10 ක් අවලංගු කර ඇති බව නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,014.10 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව අත්තිකාරම් අය කර ගැනීමට පියවර ගනිමින් සිටී. | අත්තිකාරම් බැඳුම්කර මුදල් කර අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභ අය කර ගත යුතු අතර විනය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඈ) | වැඩසටහන විසින් කාර්යසාධන බැඳුම්කර මුදල් කර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් අවලංගු කරන ලද කොන්ත්‍රාත් 03 ක රු.මිලියන 690.74 ක අය විය යුතු වටිනාකම වර්ෂ 02 කට වැඩි කාලයක සිට අය නොවී පැවතිණි. එම හේතුවෙන්, කාර්යසාධන සුරක්ෂණ මුදල් කර ගැනීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට එවැනි ප්‍රමාදවීම් කොන්ත්‍රාත්කරුවන් විසින් අවස්ථාවක් කර ගනු ඇත. | වාරණ නියෝග හේතුවෙන් මුදල් කර ගැනීම් අත්හිටුවා ඇත. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශනයක් පැවැත්විය යුතු අතර අලාභ අය කර ගත යුතුය. |

## 3.3 උපදේශන සේවා

ප්‍රාදේශීය මාර්ග නඩත්තුව ආවරණය කිරීම සඳහා මාර්ග නඩත්තු භාර අරමුදල (RMTF) පුළුල් කිරීම, ප්‍රාදේශීය මාර්ග නඩත්තු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම පුළුල් කිරීම, මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම්කරණ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම සහ වැඩසටහන සඳහා විස්තීර්ණ ගිණුම්කරණ සහ මූල්‍ය අත්පොතක් සකස් කිරීම සඳහා වැඩසටහන විසින් 2022 ජනවාරි 03 දින රාජ්‍ය පරිපාලන විශේෂඥයකු සමඟ රු. මිලියන 8.2 ක වටිනාකමකින් යුත් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග නඩත්තු භාර අරමුදල ප්‍රතිසංවිධානය කර පුළුල් කිරීමට රාජ්‍ය පරිපාලන විශේෂඥයකු පත් කර තිබුණද, 2023 අයවැය යෝජනා ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම මා.න.භා.අ. ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම අයිතමයේ විෂය පථයෙන් ආවරණය නොවූ ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කර ඇත. | දරන ලද පිරිවැය සඳහා ප්‍රතිලාභ සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියේ හා වැඩසටහනෙහි ගිණුම්කරණ පරිචයන් සඳහා අත්පොතෙහි අන්තර්ගතයන් භාවිතය පිළිබඳ සාක්ෂි විගණනයට අනාවරණය නොවිණි. | උපදේශක විසින් භාරදෙන ලද ගිණුම්කරණ සහ මූල්‍ය කළමනාකරණ අත්පොත විශ්ලේෂණය කිරීමට ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් කමිටුවක් පත් කර ඇත. ඉන් අනතුරුව, එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කමිටු වාර්තාව වැඩසටහන් කළමනාකරණ ඒකකය වෙත ලැබී ඇත. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනිමින් සිටී. | දරන ලද පිරිවැය සඳහා ප්‍රතිලාභ සහතික විය යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන විශේෂඥයකු සඳහා රු.මිලියන 5.17 ක මුදලක් ගෙවා තිබුණු අතර එය කොන්ත්‍රාත් අගයෙන් සියයට 63 ක් නියෝජනය විය. ඉලක්ක ලඟා කර ගැනීමේ අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හා ඵලදායීතාවය විගණනයේදී අවිනිශ්චිත විය. | රාජ්‍ය පරිපාලන විශේෂඥයාගේ යොමුගත නියමයන් (TOR) අනුව, පහත වාර්තා භාර දී ඇත.<br>• 2022.02.28 දින ආරම්භක වාර්තාව<br>• 2022.05.30 දින ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීමේ තක්සේරුව<br>• 2022.07.30 දින ගිණුම්කරණ සහ මූල්‍ය කළමනාකරණ අත්පොත<br>• 2022.12.02 දින ග්‍රාමීය මාර්ග නඩත්තු සඳහා මූල්‍ය සැලසුම | දරන ලද පිරිවැය සඳහා ප්‍රතිලාභය සහතික වියයුතුය. |

**3.4 ඌන උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාමාන්‍යයෙන් මුළු ණය මුදල වන එ.ජ.ඩො. මිලියන 900, බහු මූල්‍ය පහසුකම යටතේ අදියර කිහිපයක් මඟින් වරින් වර ප්‍රදානකරු විසින් ණය නිදහස් කරනු ලැබේ. 2023 දෙසැම්බර් 31 දිනට පෙර ණය ප්‍රදානකරු විසින් ඔවුන්ගේ නිත්‍ය නිකුත්කිරීමේ ක්‍රමයට (regular disbursement method) එ.ජ.ඩො. මිලියන 500 ක් අදියර 03 ක් යටතේ නිදහස් කර තිබුණි. කෙසේවුවද, සාර්ව ආර්ථික අර්බුදය හේතුවෙන් එම ක්‍රියාවලිය අත්හිටුවන ලදී. පසුව, අසම්පූර්ණ මාර්ග කොටස් හා මේ වන විටත් ආරම්භ කර ඇති අත්‍යාවශ්‍ය වැඩ ඉටුකිරීමට, ආරම්භ නොකරන ලද මාර්ගවල නඩත්තුකිරීම් සහ අයිමාර්ග හා දෙවන අයිමාර්ග වැඩසටහන්වල පූර්ව වැඩ නිම කිරීම් සඳහා ගෙවීම් කිරීමට වැඩසටහනේ 04 වන අදියර යටතේ එ.ජ.ඩො. මිලියන 60 ක් තවදුරටත් සැපයීමට තීරණය කර තිබුණි. ණය ගිවිසුම ප්‍රකාරව, එකඟ වූ ණය වටිනාකම වන රු.මිලියන 137,070 කට සමාන එ.ජ.ඩො. මිලියන 900 න් රු.මිලියන 109,316 කට සමාන එ.ජ.ඩො. මිලියන 508.52 ක් 2023 දෙසැම්බර් 31 වන විට උපයෝජනය කර තිබුණු අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 56.50 | මෙම වැඩසටහන වර්ෂ 10 ක ක්‍රියාත්මක කිරීමේ කාලයක් සහිත බහු අදියර මූල්‍ය පහසුකමකි. එ.ජ.ඩො. මිලියන 560 ක මුදලක් අදියර 4 ක් යටතේ ලැබුණු අතර ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස රජයේ ණය ගැනීම් සීමාවීම හේතුවෙන් ඉතිරි මුදල වූ එ.ජ.ඩො. මිලියන 340 අවිනිශ්චිත වේ. මෑතකදී අනුමත කරන ලද අයිමාර්ග II හි අදියර 4 යටතේ අයිමාර්ග I හා අයිමාර්ග II වැඩසටහන්වල වියදම් සඳහා ප්‍රතිපාදන ඇත. ඒ අනුව ගෙවීම් සිදු කර ඇත. | විෂය පථය සීමාකිරීම් (Descope) යටතේ වූ ප්‍රතිපාදන සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් පදනම් කරගෙන නිසි ක්‍රියාකාරී සැලැසමක් සකස් කර අනුමත කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් විය. 2023 දෙසැම්බර් 31 දිනට ඉන් රු.මිලියන 1,376.64 ක් අයිමාර්ග වැඩසටහනෙහි සිවිල් වැඩ සඳහා වියදම් කර තිබුණි. | | |
| (ආ) | දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ අදියර 4 සඳහා 2023 නොවැම්බර් 28 දින අත්සන් කරන ලද ණය ගිවිසුම ප්‍රකාරව, දැනටමත් ආරම්භ කර ඇති හා වැඩ අසම්පූර්ණ මාර්ග කොටස්වල අත්‍යවශ්‍ය වැඩ සඳහා යොමු වීමට සහ පෙර ඉටු කරන ලද වැඩ සඳහා ගෙවීම් කිරීමට අයිමාර්ග හා දෙවන අයිමාර්ග වැඩසටහන් දෙක සඳහා එ.ජ.ඩො. මිලියන 60 ක් එමඟින් සපයා තිබුණි. ඉන් රු.මිලියන 2,935.33 කට සමාන එ.ජ.ඩො. මිලියන 8.98 ක් පමණක් 2023 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර (disbursed) තිබුණි. | 2023 දෙසැම්බර් 03 සිට ණය අදියර 4 ක්‍රියාත්මක අතර ණය කාල සීමාව අවසන්වන 2027 මාර්තු 31 දක්වා ණය නිකුත්කිරීමට සැලසුම් කර ඇත. සැලසුම් කළ අත්‍යවශ්‍ය වැඩ අවසන් වූ පසු අදියර 4 හි ප්‍රධාන ණය කොටස 2024 හා 2025 දී උපයෝජනය කරනු ඇත. | නිසි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු අතර සංශෝධිත පහසුකම් පරිපාලන අත්පොත අනුමත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 23,699.50 ක් ප්‍රතිපාදනය කිරීමට මූලිකව තීරණය කළද, ප්‍රතිගාමී මූල්‍යකරණය (retroactive finance) යටතේ රු.මිලියන 3,600 ක මුදලක් දේශීය අරමුදල් මඟින් පරිපූරක ඇස්තමේන්තු යටතේ ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,992.85 ක් හෝ සියයට 14.63 ක් උපයෝජනය කර තිබුණි. | 2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර තිබුණද, ඊළඟ ණය වාරිකය ලැබෙන තෙක් තාවකාලිකව වැඩ නතර කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දී තිබුණි. 2023 දෙසැම්බර් 03 සිට අයිමාර්ග II හි ණය අදියර 4 ක්‍රියාත්මක විය. එම නිසා සත්‍ය වියදම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු විය. | ප්‍රතිපාදන සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ප්‍රමාදයකින් තොරව ප්‍රතිඵල ලබා කර ගැනීමට ඵලදායී පියවර ගත යුතුය. |

**3.5 මතභේදාත්මක ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2023 ජුලි 13 දින ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා නිකුත් කරන ලද රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාවට අනුව, වැඩසටහන යටතේ ඉදිරි මධ්‍ය කාලය තුළ දැනටමත් වැඩ ආරම්භ කර ඇති මාර්ග මෝටර් රථ ධාවනය කළ හැකි තත්ත්වයට පත් කිරීමට කමිටුව විසින් නිර්දේශ කළද, ඉහත කමිටු තීරණවලට පටහැනිව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 321.71 ක් වූ කි.මී. 9.02 ක දිගින් යුතු ගම්පහ දිස්ත්‍රික්කයේ නව මාර්ග 04 ක් පුනරුත්ථාපනය කිරීම වැඩසටහන විසින් ආරම්භ කර තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම මාර්ග දැනටමත් මූලික විෂය පථයට ඇතුළත් කර ඇත. මාර්ගවල අත්‍යවශ්‍ය වැඩ ඉටුකිරීම සඳහා පමණක් ආ.සං.බැ. විසින් ණය අදියර 4 ප්‍රදානය කර ඇත. ආ.සං.බැ. මාරගෝපදේශ අනුව, දැනටමත් පුනරුත්ථාපනය කරමින් පවතින මාර්ග (අර්ධ වශයෙන් සම්පූර්ණ) මෙන්ම පෙර වර්ෂවල කිසිඳු කාර්යයක් සිදු නොකළ (untouched) මාර්ගවල මෙම අත්‍යවශ්‍ය වැඩ හඳුනාගෙන ඇත. එමනිසා, මෙම මාර්ග දැඩිව හානි වී තිබීම හා එම කාලය වන විට නිසි ධාවන තත්ත්වයේ නොතිබීම නිසා වැඩසටහන විසින් මෙම මාර්ග 04 හි අත්‍යවශ්‍ය වැඩ හඳුනාගෙන තිබුණි. | කමිටු නිර්දේශ පිළිපැදිය යුතු මෙන්ම කමිටු නිර්දේශවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතු අතර නව අනුමැතීන් ලබා ගත යුතුය. |